දුරකථන ) 0112669192,0112675011
தொலைபேசி ) 01126940330112675280
Telephone ) 0112675449

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax ) 0112692913

විද්‍යුත් තැපෑල ) postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ් අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )

මගේ අංකය )
எனது இல )
My No. ) CF/EXW/11/2025
ඔබේ අංකය )
உமது இல )
Your No. : )

දිනය )
திகதி )2025/03/18
Date )

සුවසිරිපාය
சுவசிரிபாய
**SUWASIRIPAYA**

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
சுகாதார மற்றும் வெகுஜன ஊடக அமைச்சு
Ministry of Health & Mass Media

---

**පොදු චක්‍රලේඛ ලිපි අංක :- 02 – 31/2025**

පළාත් සෞඛ්‍ය ලේකම්වරුන්,

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් - ශ්‍රී ලංකා ජාතික රෝහල, කොළඹ,

අධ්‍යක්ෂ - ජාතික රෝහල, මහනුවර,

අධ්‍යක්ෂ - ජාතික රෝහල, ගාල්ල,

රේඛීය අමාත්‍යාංශය යටතට ගැනෙන සියලුම රෝහල් අධ්‍යක්ෂවරුන්,

පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,

ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,

අදාල ආයතන ප්‍රධානින් වෙත.

**ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ III ශ්‍රේණියට අයත් නිලධාරීන්ගේ පළමු වන දෙපාර්තමේන්තු පරීක්ෂණය – 2025 (පළමු වාරය)**

ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ III ශ්‍රේණියේ නිලධාරීන් සිය පළමු පත්වීමේ දින සිට වසර තුනක් ගතවීමට පෙර සමත් වියයුතු දෙපාර්තමේන්තු පරීක්ෂණය **2025/05/04** වන දින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. විභාගය පවත්වනු ලබන ස්ථානය හා වේලාව ප්‍රවේශ පත්‍රයේ සඳහන් කරනු ඇත.

02 **සුදුසුකම්**

මෙම විභාගයට අයදුම් කළ හැක්කේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 (SL - 01 - 2006) නව බඳවා ගැනීමේ පටිපාටියට අනුව ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ III ශ්‍රේණියට අයත් මේ වන තෙක් විභාගය සම්පූර්ණ කර නොමැති නිලධාරීන්ට පමණි.

03 **අයදුම්පත්**

මෙම චක්‍රලේඛ ලිපියේ අවසානයේ දක්වා ඇති ආකෘතියට අනුව අයදුම්කරුවන් විසින් සකස් කර ගත යුතු අයදුම්පත් ආයතන ප්‍රධානියා මඟින්, කොළඹ 10, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, අංක 385, "සුවසිරිපාය" සෞඛ්‍ය අමාත්‍යාංශය අධ්‍යක්ෂ (විභාග) වෙත **2025/04/09** දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියුම් කවරයෙහි වම්පස ඉහළ කෙළවරෙහි **"ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන දෙපාර්තමේන්තු පරීක්ෂණය - 2025 (පළමු වාරය) "** ලෙස සඳහන් කළ යුතුය. **මෙම දෙපාර්තමේන්තු පරීක්ෂණයට පෙනී සිටීමට අයදුම්කරු විසින් අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති බවට පෞද්ගලික ලිපිගොනු භාර විෂය නිලධාරියා විසින්ද, සෑම අයදුම්පතකම දක්වා ඇති තොරතුරු සියල්ල නිවැරදි බව ආයතන ප්‍රධානියා විසින්ද සහතික කර තිබීම අනිවාර්යය වේ.** තම අයදුම්පත සමඟ රාජකාරී ලිපිනය හෝ පෞද්ගලික ලිපිනය ලියන ලද රු.110.00 ක් වටිනා මුද්දර ඇලවූ "9X4" ප්‍රමාණයේ ලියුම් කවරයක් ද එවිය යුතුය. **ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්ද, අසම්පූර්ණ හෝ වැරදි සහිත වන අයදුම්පත්ද කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

සැ.යු.:- ආදර්ශ අයදුම්පතෙහි ආකෘතියට අනුව, අයදුම්පත්‍රය A4 කඩදාසියක පළමු පිටුවේ අංක 01 සිට 04 දක්වාත් දෙවන පිටුවේ අංක 05 සිට 08 දක්වාත් සකස් කළ යුතුය. ඉහත ආකෘතියට අනුකූල නොවන සියළුම අයදුම්පත්‍ර නැවත දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04 විභාග ගාස්තු

I විභාගයට පළමුවරට ඉදිරිපත්වන අයදුම්කරුවන් විභාග ගාස්තුවලින් නිදහස් කරනු ලැබේ. අනෙකුත් අයදුම්කරුවන් එක් විෂයකට රු 25 බැගින් අවලංගු නොකල මුද්දර අයදුම් පත්‍රයේ අලවා තමන්ගේ අත්සන හා දිනය යොදා අවලංගු කල යුතුය.

II කිසිදු කරුණක් මත ගෙවන ලද විභාග ගාස්තු වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ ආපසු ගෙවීමක් සිදුකරනු නොලැබේ.

05 විභාගයට ඇතුළත්කර ගැනීම.

I පිළිගත් අයදුම්පත් සඳහා අපේක්ෂක/අපේක්ෂිකාවන්ට ප්‍රවේශපත් නිකුත් කරනු ලැබේ. එම ප්‍රවේශ පත්‍රය නියමිත පරිදි සම්පූර්ණ කර විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. එසේ නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ.

II විභාග අපේක්ෂක/ අපේක්ෂිකාවන් විසින් විභාග ශාලාව තුලදී විභාග ශාලාධිපතිට ස්වකීය අනන්‍යතාවය තහවුරු කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලියකියවිලි වලින් එකක් ඉදිරිපත් කළ යුතුය.

(අ) ජාතික හැඳුනුම්පත

(ආ) සෞඛ්‍ය අමාත්‍යාංශය හෝ ඊට අදාළ ආයතනයක් මඟින් විධිමත් ලෙස නිකුත් කරන ලද හැඳුනුම්පත

(ඇ) වලංගු රියදුරු බලපත්‍රය

(ඈ) වලංගු විදේශ ගමන් බලපත්‍රය

06 විභාග පටිපාටිය

(අ) දෙපාර්තමේන්තු රෙගුලාසි

මෙම විභාගය ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයට අදාළ දෙපාර්තමේන්තු හා ආයතන ක්‍රමවේදයන් පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම සඳහා සකස් කරන ලද පැය 03 ක රචනා මාදිලියේ ප්‍රශ්න පත්‍රයකින් සමන්විතය. එහි ක්ෂේත්‍ර පහකට අදාළව ප්‍රශ්න 10ක් වන අතර, එක් කොටසකින් එක් ප්‍රශ්නයක් ඇතුළත් වන පරිදි ප්‍රශ්න 05 කට පිළිතුරු සැපයිය යුතුය. මුළු ලකුණු 100 ක් වන අතර සමත්වීම සඳහා අවම වශයෙන් ලකුණු 40 ක් ලබාගත යුතුය.

07 විෂය නිර්දේශය

07.1 ගබඩා කළමනාකරණය

(i). ගබඩා සමීක්ෂණය

(ii). හානි සහ පාඩු පිළිබඳ වාර්තා

(iii). විසර්ජන ගිණුම

(iv). බැංකු සැසඳුම් ප්‍රකාශය

(v). මුදල් පොත

(vi). වැය ලෙජරය

(vii). මූල්‍ය බලතල පැවරීම

**08. විභාග සම්බන්ධ රෙගුලාසි අනුගමනය කිරීම**

අපේක්ෂකයින් විසින් වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ කුමන හෝ පොතකින්, හෝ කවර ආකාරයක සටහන් සහිත කොළයකින්, හෝ වෙනත් කිසිවකින් හෝ ගෙන බලා උත්තර ලිවීම තහනම්ය. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය දෙස බැලීමද නොකළ යුතුය. එසේම වෙනත් අයදුම්කරුවෙකුට උදව් කිරීමෙන් හෝ වෙනත් අයදුම්කරුවකුගෙන් හෝ පුද්ගලයකුගෙන් උදව් ලබාගැනීමෙන්ද වැළකී සිටිය යුතුය. තවද ජංගම දුරකථන හා ඒ හා සමාන සන්නිවේදන හා විද්‍යුත් උපකරණද භාවිතා කිරීමෙන් වැළකී සිටිය යුතුය. මෙම නීති කඩ කරනු ලබන ඕනෑම අපේක්ෂකයෙකු දඬුවම් ලැබීමට යටත් වනු ඇත.

09. කරුණාකර මෙම චක්‍රලේඛ ලිපියේ අඩංගු දෑ ඔබ ආයතනයේ සේවයේ නියුතු අදාල නිළධාරීන්ගේ දැනගැනීමට සලස්වන්න. මෙම තොරතුරු www.health.gov.lk වෙබ් අඩවියේ ද අතුලත් කර ඇත.

**සැ.යු - මෙම චක්‍රලේඛ ලිපියේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි නිවේදනයන්හි පාඨ අතර යම් අනනුකූලතාවයක් මතු වුවහොත් සිංහල මාධ්‍ය විභාග නිවේදනය බලපැවැත්වේ.**

යූ ඒ එස් එච් සිසිර කුමාර
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) II
ලේකම් වෙනුවට

යූ.ඒ.එස්. හර්ෂප්‍රිය සිසිර කුමාර
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) - II
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
කොළඹ 10.

385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10. 385,வணக்கத்துக்குரியபத்தேகமவிமலவங்சதேரோமாவத்தை,கொழும்பு 10.
385, Rev. BaddegamaWimalawansaTheroMawatha, Colombo 10, Sri Lanka.

## 07.2 වැඩ ඇස්තමේන්තු

(i). වැය ශීර්ෂය
(ii). සකස් කිරීම, පරීක්ෂා කිරීම, අනුමත කිරීම
(iii). අනුමත ඇස්තමේන්තුවක් සඳහා අමතර ප්‍රතිපාදන ලබා ගැනීම
(iv). ඇස්තමේන්තු සංශෝධනය
(v). අනුමත ඇස්තමේන්තුවක ප්‍රමාණ හා මිලගණන් වෙනස්වීම්
(vi). ගෙවීම්

## 07.3 ටෙන්ඩර් පරිපාටිය

(i). විවිධ මට්ටම්වල ටෙන්ඩර් මණ්ඩල, ටෙන්ඩර් මණ්ඩල ව්‍යුහය, හා ටෙන්ඩර් කැඳවීම, ටෙන්ඩර් පිරිනැමීම සහ ගිවිසුම්වලට එළඹීමේ ක්‍රියාදාමය
(ii). ටෙන්ඩර් ක්‍රියා පටිපාටියෙන් බැහැරව ක්‍රියාකිරීමේ බලතල
(iii). පිළිගත් සමිති හා සංවිධානවලට කොන්ත්‍රාත් පැවරීම
(iv). කොන්ත්‍රාත් පැවරීම, කොන්ත්‍රාත් අධීක්ෂණය හා උප කොන්ත්‍රාත්
(v). අභියාචනා හා කොන්ත්‍රාත් අමතර ගෙවීම්
(vi). අලාභ හා ප්‍රමාද ගාස්තු අයකිරීම
(vii). අවසන් ගෙවීම් සහතික හා නඩත්තු කාල සීමාව
(viii). කොන්ත්‍රාත් අසාදු ලේඛනය
(ix). ටෙන්ඩර් හා ආරක්ෂණ ඇප
(x). කොන්ත්‍රාත් අවලංගු කිරීම

## 07.4 කොන්ත්‍රාත් පදනම යටතේ වන ගොඩනැගිලි ඉදිකිරීම් අධීක්ෂණය

(i). මිලදී ගැනීම්
(ii). තත්ත්ව පාලනය
(iii). වැඩසටහන් සකස් කිරීම
(iv). ප්‍රගති පාලනය
(v). කොන්ත්‍රාත්කරුගේ වගකීම හා වැඩ අවසන් කිරීම
(vi). කොන්ත්‍රාත්කරුගේ ගෙවීම් වාර්තා සහතික කිරීම

## 07.5 වාහන මිලදී ගැනීම් හා නඩත්තුව

(i). ප්‍රාදේශීය මිලදී ගැනීම්, වාහන අමතර කොටස් මිලදී ගැනීම හා වාහන අලුත්වැඩියා කිරීමේ බලපැවැත්වෙන සීමාවන්
(ii). කොන්ත්‍රාත් පදනම යටතේ වන යන්ත්‍ර ස්ථාපනය කිරීම හා අධීක්ෂණය කිරීම

**EXW**

| කාර්යාලීය ප්‍රයෝජනය සඳහා |
|---|
| |

ආදර්ශ අයදුම්පත

**ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ III ශ්‍රේණියට අයත් නිළධාරීන්ගේ පළමුවන දෙපාර්තමේන්තු පරීක්ෂණය – 2025 (පළමු වාරය)**

**01.** (අ) (i) අයදුම්කරුගේ සම්පූර්ණ නම (සිංහලෙන්)..............................................

..............................................................................................

(ii) අයදුම්කරුගේ සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

| | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | |

(iii) මුලකුරු සමඟ නම (සිංහලෙන්)..............................................

..............................................................................................

(iv) මුලකුරු සමඟ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

| | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | |

(ආ) (i) III ශ්‍රේණියට පත් වූ දිනය :- ..............................................

(ii) III ශ්‍රේණියට පත් වූ ලිපි අංකය :- ..............................................

(iii) දැනට ලබන වාර්ෂික වැටුප :- ..............................................

(iv) ජංගම දුරකථන අංකය :-

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

(v) ජාතික හැඳුනුම්පත් අංකය:-

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

(vi) විද්‍යුත් ලිපිනය :- ..............................................

**02.** (අ) දැනට සේවය කරන ආයතනය (සිංහලෙන්) :-..............................................

(ඉංග්‍රීසියෙන්) :-..............................................

(ආ) මෙම ආයතනය අයත් වන්නේ - රේඛීය අමාත්‍යාංශයට ☐

- පළාත් සභාවට ☐

(ඇ) පළාත් සභාවට නම් අදාල පළාත:-..............................................

(ඈ) ආයතනය අයත් දිස්ත්‍රික්කය :-..............................................

(ඉ) විභාග ප්‍රවේශ පත්‍රය එවීම සඳහා නිවැරදිව හා පැහැදිලිව ලිපිනය ලියන ලද 9" X 4" ප්‍රමාණයේ රු 110.00ක මුද්දර ඇලවූ ලියුම් කවරයක් අයදුම්පත්‍රයට අමුණන ලද්දේද?..............................

(ඊ) (i) තැපැල් ලිපිනය (සිංහලෙන්) ..............................................

..............................................................................................

(ii) තැපැල් ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

..............................................................................................

..............................................................................................

**03.** විභාගයට පෙනී සිටින මාධ්‍යය (සිංහල / දෙමළ / ඉංග්‍රීසි) ..............................................

**04.** (අ) මීට ප්‍රථම මෙම විභාගයට පෙනී සිටියේද?..............................................

(ආ) අයදුම්පත් ඉදිරිපත් කරන්නේ ප්‍රථම වරට නොවේ නම් මුද්දර අලවා තිබේද? ........................

| මුද්දර කොටුව |
|---|
| |

**05.** **අයදුම්කරුගේ සහතිකය**

මගේ දැනුම හා විශ්වාසය පරිදි,

i මෙම අයදුම්පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බවත් මෙම විභාගයට මා පෙනී සිටින්නේ ප්‍රථම වතාවට බැවින් විභාග ගාස්තු ගෙවීම අනවශ්‍ය බවත් / ප්‍රථම වතාවට නොවන බැවින් රු..............ක් වටිනා මුද්දර අලවා ඇති බවත් * මෙම අයදුම්පත්‍රයට මා විසින් අලවා ඇති මුද්දර අවලංගු කිරීමට පෙර වලංගු වූ පාවිච්චි නොකරන ලද මුද්දර බවත් ප්‍රකාශ කරමි.

ii සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් විභාග පිළිබඳව පනවා ඇති නීතිරීතිවලට එකඟව ක්‍රියා කිරීමටත් මෙම විභාගය පිළිබඳ ව්‍යවස්ථාව අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, මගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන කවර හෝ තීරණයකට මම එකඟ වන බවත් මෙයින් සහතික කරමි.

...............................

දිනය .........................                                   අයදුම්කරුගේ අත්සන

**06.** **පෞද්ගලික ලිපිගොනු භාර විෂය නිලධාරියාගේ/නිලධාරිණියගේ සහතිකය**

මෙම අයදුම්පත් භාර ගන්න අවසාන දිනයට පෙර/පසු මා වෙත භාරදුන් බවත්, පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරුවලට අනුව අයදුම්කරු විසින් නිවැරදිව මෙම අයදුම්පත සම්පූර්ණ කර ඇති බවත්, III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගයට පෙනී සිටීමට අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති බවත් මෙම අයදුම්පතේ පිටපතක් පෞද්ගලික ලිපිගොනුවට ගොනුකළ බවත් සහතික කරමි.

දිනය .........................                                   ...............................

නම සහ අත්සන

**07.** **ආයතන ප්‍රධානියාගේ සහතිකය**

......................................මහතා/මහත්මිය/මෙනවිය ....................... නිලධාරියෙකු වශයෙන් මෙම ආයතනයේ සේවය කරන බවටත්, අයදුම්පතේ ඇතුලත් කර ඇති තොරතුරු නිවැරදි බවත්, අයදුම්කරු විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට බවත් / ප්‍රථම වතාවට නොවන බවත්, විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබා ඇති බවත්, රු. 25 ක් වටිනා මුද්දර මෙම අයදුම්පත්‍රයට අලවා ඇති බවද මුද්දර ඇලවීම අනවශ්‍ය බවද, අයදුම්පතේ ඇතුලත් කර ඇති තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරු අනුව නිවැරදි බවත්, මා ඉදිරිපිටදී අත්සන් කළ බවද සහතික කරමි.

දිනය .........................                                   ...............................

ආයතන ප්‍රධානියාගේ අත්සන

[රබර් මුද්‍රාව තැබිය යුතුය]

**08.** **විමධ්‍යගත කොට්ඨාශ / විශේෂිත ව්‍යාපාර ප්‍රධානියාගේ සහතිකය**

.........................................        මහතා/මහත්මිය/මෙනවිය,......................................... නිලධාරියෙකු වශයෙන් මගේ ආයතනයේ, සේවය කරන බවත්, අයදුම්පතේ දි තිබෙන තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරු අනුව නිවැරදි බවත්, මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට / ඇයට සුදුසුකම් ඇති බවත් සහතික කරමි.

දිනය .........................                                   ...............................

විමධ්‍යගත කොට්ඨාශ

විශේෂිත ව්‍යාපාර ප්‍රධානියාගේ අත්සන

[රබර් මුද්‍රාව තැබිය යුතුය]

(අනවශ්‍ය කොටස් කපා හරින්න)